# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2481/28 – 2026 මාර්තු මස 27 වැනි සිකුරාදා – 2026.03.27**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


## I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

### රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2021/103.

**කාර්මික ආරාවුල් පනත – 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2022.11.19 දිනැති හා අංක 2306/86 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.11.14 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මාතර, වල්ගම, පේරගහ කොරටුව ලිපිනයෙහි පදිංචි කේ. ඒ. පියසිරි මහතා සහ ගාල්ල, පහළ ඩික්සන් පාර, අංක 19 ලිපිනයෙහි පිහිටි දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/80/2022 හා 2025.12.09 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2026 මාර්තු මස 05 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ප්‍රදානයයි

**කොළඹ දී පැවැත්වෙන බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේ දී ය.**

කේ. ඒ. පියසිරි මහතා,
පේරගහ කොරටුව,
වල්ගම,
මාතර.

නඩු අංකය - A/80/2022
යොමු අංකය - IR/COM/03/2021/103

සහ

දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය,
අංක 19,
පහළ ඩික්සන් පාර,
ගාල්ල.

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් වර්ෂ 2022.11.14 වන දින මා පත්කොට පහත යොමුව මා වෙත යොමු කර ඇත.

මෙම කාර්මික ආරාවුල අරභයා හේතු පාදක වී ඇති කරුණ සම්බන්ධව කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ 2022.11.03 දිනැති යොමුව පහත පරිදි වේ.

“කේ. ඒ. පියසිරි මහතා වසර 12 කට ආසන්න කාලයක් අඛණ්ඩව භුක්ති විඳි තනතුර හා වැටුප අහිමිකිරීම මඟින් ඔහුට අසාධාරණයක් සිදු වී තිබේද යන්න හා එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්න පිළිබඳව වේ.”

**පෙනී සිටීම**

පළමු පාර්ශ්වය වෙනුවෙන් ඉල්ලුම්කරු සමඟ නීතිඥ ශෂික හෙට්ටිආරච්චි මහතා පෙනී සිටි අතර, දෙවන පාර්ශ්වය වෙනුවෙන් පරිපාලන නිලධාරිනි ගිණිගේ තුෂාරි ද සිල්වා මහත්මිය සමඟ නීතිඥ හිරුණි ද අල්මේදා මහත්මිය පෙනී සිටින ලදී.

මෙම ආරාවුලට අදාළව කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්මික අධිකරණ ලිපි ශීර්ෂය යටතේ ආරාවුලේ දෙපාර්ශ්වයට මෙම ආරාවුල බේරුම්කරණයට ගන්නා බවත් ආරාවුලට අදාළව දෙපාර්ශ්වයේ කරුණු ප්‍රකාශයන් 2022.12.13 වන දිනට ප්‍රථමව බේරුම්කරණය වෙත ඉදිරිපත් කරන ලෙස දන්වා 2022.11.23 දිනැතිව ලියාපදිංචි තැපෑලෙන් දෙපාර්ශ්වයට ලිපි නිකුත් කරන ලදී.

පළමු පාර්ශ්වය විසින් සිය පළමු විස්තර ප්‍රකාශය 2023.01.03 දින විවෘත අධිකරණයේ දී බේරුම්කරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ අතර දෙවන පාර්ශ්වය විසින් එහිදී මූලික විරෝධතාවයක් ගැනීමට බලාපොරොත්තු වන බව විවෘත අධිකරණයේ දී දන්වා සිටින ලද හෙයින් දෙවන පාර්ශ්වයේ මූලික විරෝධතා සඳහා 2023.01.30 දිනට දින ලබා දෙන ලදී. දෙවන පාර්ශ්වයේ පළමු ප්‍රකාශය තුළින් සිය මූලික විරෝධතාව 2023.01.30 වන දින විවෘත අධිකරණයේ දී ඉදිරිපත් කළ අතර අදාළ මූලික විරෝධතාවය වූයේ “පළමු පාර්ශ්වය සහ දෙවන පාර්ශ්වය අතර සජීවී ආරාවුලක් (live dispute) නොපවතින බවත්, ඒ අනුව 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනතේ 17 වගන්තිය අනුව මෙම ආරාවුල අසා ප්‍රදානයක් ලබා දීමට මෙම බේරුම්කරණ අධිකරණයට අධිකරණ බලයක් නොමැති බවත්, ඒ අනුව පළමු පාර්ශ්වයේ ඉල්ලුම් පත්‍රය මුල් අවස්ථාවේ දීම නිෂ්ප්‍රභා විය යුතු බවත්” වේ. ඊට ප්‍රතිචාර වශයෙන් 2023.03.14 දින පළමු පාර්ශ්වය විසින් ප්‍රතිවිරෝධතා ප්‍රකාශය මඟින් අදාළ මූලික විරෝධතාවයට ප්‍රතිවිරෝධතා ද ගෙන එන ලද බැවින් මූලික විරෝධතාවය සම්බන්ධව නියෝගය 2023.04.27 වන දින ප්‍රකාශයට පත් කරන ලදී.

එකී නියෝගය මගින් ඒ අනුව දෙවන පාර්ශ්වයේ මූලික විරෝධතාවයට අදාළව කාරණා වැඩිදුර ලේඛන හා සාක්ෂි මගින් තහවුරු කිරීමට යටත්ව දෙවන පාර්ශ්වය විසින් ගෙනා මූලික විරෝධතාවය සම්බන්ධව අවසන් බේරුම්කරණ ප්‍රදානයේදී තීරණයක් ලබා දීමට තීරණය කරමින් ආරාවුල විභාගයට ගැනීමට නියෝග කරන ලදී.

ඒ අනුව පළමු පාර්ශ්වයේ මූලික සාක්ෂිය A.1 සිට A.19 දක්වා වූ ලේඛන ද ලකුණු කරමින් 2023.05.13 දිනැති මූලික සාක්ෂි දිවුරුම් ප්‍රකාශයක් මඟින් ඉදිරිපත් කරනු ලැබූ අතර 2023.06.23 වන දින පළමු පාර්ශ්වයේ සාක්ෂි විභාගය අවසාන කරන ලද අතර පළමු පාර්ශ්වය විසින් පළමු පාර්ශ්වය වෙත හිමිවිය යුතු හිඟ වැටුප් සහ අනෙකුත් ප්‍රතිලාභ ප්‍රමාණය පිළිබඳව විස්තර පත්‍රයක් 2024.02.06 දින ඉදිරිපත් කළ අතර ඉන් අනතුරුව දෙවන පාර්ශ්වයේ සාක්ෂි විමසුම 2024.03.11, 2024.05.16, 2024.06.24, 2024.07.29, 2024.09.12 යන දින වලදී පවත්වා අවසන් කළ අතර දෙපාර්ශ්වයේ අවසාන ලිඛිත දේශන ඉදිරිපත් කිරීම සඳහා 2024.12.06 වන දිනට දෙපාර්ශ්වයට දින නියම කරන ලදී.

ඒ අනුව 2024.12.06 වන දින සිය අවසාන ලිඛිත දේශනය මඟින් සිය මූලික සාක්ෂි දිවුරුම් ප්‍රකාශයේ දී දැනටමත් ලකුණු කර ඇති A.1 සිට A.19 දක්වා වූ ලේඛන එහි කොටසක් කරමින් ද ඊට අමතරව A.20 සිට A.43 දක්වා ලකුණු කල ලේඛන ද A.9(1) ලේඛනය ද ඉදිරිපත් කළ අතර දෙවන පාර්ශ්වය විසින් ද එදින ඇමුණුම් රහිත සිය අවසාන ලිඛිත දේශනය බේරුම්කරණ අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද බැවින් දෙපාර්ශ්වය අතර බේරුම්කරණ විභාගය අවසාන කරමින් බේරුම්කරණ ප්‍රදානය ලබා දීම සඳහා නියම කරන ලදී.

මෙම ආරාවුල පිළිබඳව අවසානාත්මක ප්‍රදානයක් ප්‍රකාශ කිරීමට ප්‍රථමව දෙවන පාර්ශ්වය විසින් 2023.01.30 දින දෙවන පාර්ශ්වයේ පළමු ප්‍රකාශය තුළින් ගෙන එන ලද මූලික විරෝධතාව වූ "පළමු පාර්ශ්වය සහ දෙවන පාර්ශ්වය අතර සජීවී ආරාවුලක් (live dispute) නොපවතින බවත්, ඒ අනුව 1950 කාර්මික ආරාවුල් පනතේ 17 වගන්තිය අනුව මෙම ආරාවුල අසා ප්‍රදානයක් ලබා දීමට මෙම බේරුම්කරණ අධිකරණයට අධිකරණ බලයක් නොමැති බවත්, ඒ අනුව පළමු පාර්ශ්වයේ ඉල්ලුම් පත්‍රය මුල් අවස්ථාවේදීම නිෂ්ප්‍රභා විය යුතු බවත් ය" යන්නට අදාළව මෙම බේරුම්කරණ අධිකරණය මඟින් 2023.04.27 වන දින ලබා දුන් නියෝගය ප්‍රකාරව අවසානාත්මක නියෝගය ද මෙම බේරුම්කරණ ප්‍රදානය හා අනුබද්ධිතව ප්‍රදානය කිරීමට ද තීරණය කරමි.

ඒ අනුව දෙවන පාර්ශ්වයේ මූලික විරෝධතාවයට අදාළව දෙපාර්ශ්වයේ ලිඛිත සැළකිරීම් ද ආරාවුල විමසීමේ අවස්ථාවල දී දෙපාර්ශ්වයේ දීර්ඝ සාක්ෂි විභාගයෙන් අනතුරුව මතු වූ කරුණු ඇසුරෙන් ද දෙවන පාර්ශ්වය විසින් 2022.03.29 දින ගෙන එන ලද මූලික විරෝධතාවය සම්බන්ධ අවසාන තීරණය මෙසේ ප්‍රකාශයට පත් කරමි.

එහිදී මුල් අවස්ථාවේදී ම මාගේ 2023.04.27 දින නියෝගයේදී දැක්වූ පරිදි මෙහි පළමු පාර්ශ්වය 2020.11.25 දින විශ්‍රාම යාමට ආසන්න අවස්ථාව දක්වාම පළමු පාර්ශ්වය සේවයේ නියුතුව සිටි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන) තනතුර පහල හෙලීම සම්බන්ධව පළමු පාර්ශ්වය විසින් 2019.12.30 දින ගාල්ල දිස්ත්‍රික් කම්කරු කාර්යාලයට පැමිණිලි කර ඇති බවත්, ඊට අදාළව ගාල්ල දිස්ත්‍රික් කම්කරු කාර්යාලය විසින් 2020.07.29 වන දින සිය නිගමනය ප්‍රකාශයට පත් කර ඇති බවත්, දෙවන පාර්ශ්වය ඊට අනුගත නොවීම හේතුවෙන් ගාල්ල දිස්ත්‍රික් කම්කරු කාර්යාලය විසින් මෙම ආරාවුල සම්බන්ධව වැඩිදුර සළකා බැලීම සඳහා කොළඹ කම්කරු මහලේකම් කාර්යාලය වෙත යොමු කර ඇති අතර ඉන් අනතුරුව 2022.11.10 වන දින කම්කරු අමාත්‍යාංශ ලේකම්වරයාගේ අත්සනින් යුතුව කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය ප්‍රකාරව විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල යටතේ මෙම ආරාවුල මෙම බේරුම්කරණ අධිකරණය වෙත යොමු කර ඇත. පළමු පාර්ශ්වය 2020.11.25 වන දින ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගියද පළමු පාර්ශ්වය විසින් මෙම ආරාවුලට විසඳුමක් අපේක්ෂාවෙන් ඔහු දෙවන පාර්ශ්වයේ සේවකයෙකුව සිටියදී 2019.12.30 දින යොමු වී ඇති බවත්, ඒ අනුව පළමු පාර්ශ්වය ප්‍රමාදයකින් තොරව ස්වකීය ඉල්ලීම සිදු කර ඇති බවත්, එහි දී ලබා දුන් නියෝගවලට දෙවන පාර්ශ්වය විසින් අනුගත නොවීම මත එකී කාර්මික ආරාවුලට ප්‍රතිකර්මයක් පළවන පාර්ශ්වය වෙත නොලැබුණු බව පැහැදිලිය. එහි ප්‍රතිඵලයක් ලෙස මෙම ආරාවුල කොළඹ කම්කරු මහලේකම් කාර්යාලය වෙත යොමු කොට ඇති අතර අනතුරුව 2022.11.10 වන දින මෙම බේරුම්කරණ අධිකරණය වෙත යොමු කර ඇති බව නඩු ගොනුව පරීක්ෂා කිරීමේ දී තහවුරු වේ.

ඒ අනුව මෙහිදී ඉහතින් විස්තරකොට ඇති පරිදි 1950 කාර්මික ආරාවුල් පනතේ 17 වගන්තිය අනුව මෙම ආරාවුල පිළිබඳව ප්‍රදානයක් ලබාදීමට මෙම බේරුම්කරණ අධිකරණයට අධිකරණ බලයක් නොමැත්තේ ද යන්න සළකා බැලීමේදී පෙනී යන්නේ කාර්මික ආරාවුල් පනතේ ප්‍රතිපාදන හා විනිශ්චිත නඩු තීන්දු නීතිය අනුව සේව්‍ය-සේවක දෙපාර්ශ්වය අතර වලංගු සේවා ගිවිසුමක් පැවතීම හා දෙපාර්ශ්වය අතර සජීවී ආරාවුලක් (live dispute) පැවතීමේ අවශ්‍යතාවය මෙම කාර්මික ආරාවුල අසා තීරණය කර

ප්‍රදානයක් ලබා දීමේදී සැලීමට පත් විය යුතු මූලික කරුණු වන බවයි. මෙම කාර්මික ආරාවුලේ දී දෙපාර්ශ්වය අතර ආරාවුල ඇති වූ අවස්ථාවේ දී සක්‍රිය සේවා-සේවක සම්බන්ධතාවයක් පැවතුනු බවත්, ඒ අනුව දෙපාර්ශ්වය අතර සත්‍ය වශයෙන්ම සජීවී ආරාවුලක් (live dispute) පැවති බවත් පැහැදිලිය. එහෙත් බැලූ බැල්මට මෙම ආරාවුල බේරුම්කරණය වෙත යොමු කරන ලද අවස්ථාව වන විට 2020.11.25 දින පළමු පාර්ශ්වය සේවයෙන් විශ්‍රාම ගොස් ඇති බව එනම් සේවය අවසන් වී ඇති බව පැහැදිලිය. මෙම ආරාවුලේ සිද්ධිමය කරුණු විශ්ලේෂණයේදී පෙනී යන්නේ දෙවන පාර්ශ්වය විසින් නිසි ප්‍රතිකර්මයක් අපේක්ෂාවෙන් මුල් අවස්ථාවේදීම මෙම ආරාවුල නිසි බලධාරී ආයතනය වෙත යොමු කොට ඇති බවත් එකී පරීක්ෂණයෙන් අනතුරුව දෙවන පාර්ශ්වය වෙත යොමු කොට පැවති නිර්දේශය ක්‍රියාත්මක කිරීම හෝ එය අභියෝගයට ලක් කිරීමක් නොමැතිව මෙම ආරාවුල පිළිබඳව කල් මැරීමක් සිදු කොට ඇති බවයි. එසේ නොවන්නට මෙම ආරාවුල පළමු පාර්ශ්වයට සිය සේවය අවසන්වීමට මත්තෙන් බේරුම්කරණය වෙත යොමු කරවා ගැනීමට ඉඩකඩ පැවති බවට සාධාරණ ලෙස අනුමාන කළ හැක. කාර්මික ආරාවුල් පනතේ 17(1) වගන්තිය යටතේ බේරුම්කරුවෙකුගේ කාර්ය භාරය විය යුත්තේ එකී ආරාවුලට අදාළ සියලුම සාක්ෂි හා කරුණු විමර්ශණය කොට සාධාරණ හා යුක්ති සහගත තීරණයක් ලබා දීම ය. ඒ අනුව මෙම ආරාවුල විෂයභාර අමාත්‍යවරයා විසින් බේරුම්කරණය වෙත යොමු කිරීමට සිදු වූ ප්‍රමාදය පළමුවන පාර්ශ්වයේ දෝෂයක් හෝ අඩුපාඩුවකින් සිදු වූවක් බවට හෝ සිය ආරාවුලට ප්‍රතිකර්ම ඉල්ලා සිටීම පිළිබඳව නිද්‍රාශීලීව කටයුතු කළ බවට කිසිදු කරුණක් අනාවරණය වී නොමැත.

කාර්මික ආරාවුල් පනතේ 48 වගන්තිය ප්‍රකාරව "කාර්මික ආරාවුලක්" යන්න අර්ථ නිරූපණය කිරීමේදී මෙම බේරුම්කරණයට විෂය වී ඇති ආරාවුල කාර්මික ආරාවුල් ගණයට ඇතුළත් වන බව පැහැදිලිය. ඒ අනුව පෙනී යන්නේ වලංගු සේවා ගිවිසුමක් පැවති අවධියේ දෙපාර්ශ්වය අතර ඇති වූ සජීවී කාර්මික ආරාවුලක් මෙලෙස කාර්මික ආරාවුල් පනතේ 17 වගන්තිය ප්‍රකාරව කාර්මික බේරුම්කරණය වෙත යොමු කොට ඇති බවයි.

ඒ අනුව 1950 කාර්මික ආරාවුල් පනත ප්‍රකාරව අසා ප්‍රදානයක් ලබාදීමට මෙම බේරුම්කරණ අධිකරණයට අධිකරණ බලයක් ඇති බව තීරණය කිරීම සාධාරණ හා යුක්ති සහගත බව මෙයින් තීරණය කරනු ලැබේ.

ඒ අනුව මෙම කාර්මික ආරාවුල අරභයා හේතු පාදක වී ඇති කරුණ සම්බන්ධව කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ 2022.11.03 දිනැති යොමුවේ දැක්වෙන පරිදි "කේ. ඒ. පියසිරි මහතා වසර 12 කට ආසන්න කාලයක් අඛණ්ඩව භුක්ති විඳි තනතුර හා වැටුප අහිමි කිරීම මඟින් ඔහුට අසාධාරණයක් සිදුවී තිබේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ" යන්න පිළිබඳව මෙම ප්‍රදානය තුළින් අවසානාත්මක විසඳුමක් ලබා දීම සිදු කළ යුතු බවට මෙයින් තීරණය කරනු ලැබේ.

දෙවන පාර්ශ්වය විසින් 2007.07.20 වන දින පළකල පුවත්පත් දැන්වීමකට අනුව පළමු පාර්ශ්වය විසින් අයදුම් කරනු ලැබූ 2007.10.17 වන දින විධිමත් බඳවා ගැනීම් පටිපාටියකට අනුව පරිපාලන නිලධාරි IV ශ්‍රේණිය සඳහා පළමු පාර්ශ්වය සේවයට බඳවාගෙන ඇති බවත්, ඉන් අනතුරුව දෙවන පාර්ශ්වය විසින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන) තනතුරේ වැඩ බැලීම සඳහා 2008.02.01 වන දින සිට පත් කර ඇති බවත්, 2009.08.18 දිනැති ලිපිය මඟින් 2008.07.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පළමු පාර්ශ්වය සහකාර කළමනාකරු (පරිපාලන) තනතුරේ පිහිටුවනු ලැබූ බව කියා සිටියි. අනතුරුව පළමු පාර්ශ්වය විසින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන) තනතුරේ වැඩ බැලීම සිදු කර වසරක කාලයක් ඉකුත් වීමෙන් අනතුරුව ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 12:5:3 වගන්තිය යටතේ වැඩ බලන තනතුරේ ආරම්භක වැටුප තමාට ලබා දෙන ලෙසට දෙවන පාර්ශ්වයේ සාමාන්‍යාධිකාරි වෙත 2009.11.16 දිනැති ලිපියක් මඟින් ඉල්ලීමක් කර ඇති බවත් දෙවන පාර්ශ්වයේ 2009.11.25 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී එකී තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බැවින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන) තනතුර ප්‍රදානය කිරීමටත්, එම තනතුරේ ආරම්භක වැටුප පළමු පාර්ශ්වය වෙත ලබා දීමට තීරණය කර ඇති බවත් ය.

කෙසේ නමුත් පළමු පාර්ශ්වය වසර දහයකට (10) ආසන්න කාලයක් එකී තනතුරේ සේවය කරමින් සිටින අතරතුර දෙවන පාර්ශ්වය විසින් එම තනතුර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරක් නොවන බව පවසමින් 2019.07.15 දිනැති ලිපියක් මඟින් දැනුම් දී ඇති අතර, එහිදී පළමු පාර්ශ්වයට සහකාර කළමනාකරු (පරිපාලන) තනතුරට හිමි වැටුප නිර්දේශ කර එකී තනතුරට වඩා වැඩි වැටුපක් ගෙවා ඇත්නම් එය ආපසු අය කරවා ගැනීමට ද තීරණය කර ඇත.

දෙවන පාර්ශ්වයේ එකී තීරණයෙන් පළමු පාර්ශ්වයේ නීත්‍යානුකූල අපේක්ෂාවන් බිඳවැටී ඇති බවත් ඉන් අතෘප්තියට පත් පළමු පාර්ශ්වය 2019.12.30 දින ගාල්ල දිස්ත්‍රික් කම්කරු කාර්යාලය වෙත පැමිණිලි කර ඇති අතර එහිදී ලබා දුන් තීන්දුවට දෙවන පාර්ශ්වය විසින් අනුගත නොවීම හේතුවෙන් මෙම ආරාවුල කොළඹ කම්කරු දෙපාර්තමේන්තුව වෙත යොමු කොට ඇත.

කෙසේ නමුත් ඉන් අනතුරුව පළමු පාර්ශ්වය විසින් 2020.09.25 දිනැති ලිපිය මඟින් දෙවන පාර්ශ්වයෙන් සේවයෙන් විශ්‍රාම ගැන්වීමට ඉල්ලා ඇති අතර එකී ඉල්ලීම ප්‍රකාරව දෙවන පාර්ශ්වය විසින් පළමු පාර්ශ්වය 2020.11.25 වන දින සිට සේවයෙන් විශ්‍රාම ගන්වා ඇත.

ඒ අනුව මෙම බේරුම්කරණ අධිකරණයේ පවත්වනු ලැබූ විමර්ශණය අවසානයේ දී පහත කරුණු නිරීක්ෂණය වේ.

දෙවන පාර්ශ්වය වන මෙම අධිකාරියේ එකී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන) යන තනතුර මෙම ආරාවුල උද්ගත වන අවස්ථාව දක්වා මීත් පෙර පැවති තනතුරක් බවත් දෙවන පාර්ශ්වය විසින් 1996.09.05 දින පුවත්පත් දැන්වීමක් පළකර සම්මුඛ පරීක්ෂණයක් පවත්වා 1997.01.01 වන දින සිට සී. කන්නන්ගර යන අයව එකී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන) තනතුර ප්‍රදානය කර තිබූ බවත්, ඔහු 2006.12.31 දින එකී තනතුරෙන් විශ්‍රාම යාමෙන් අනතුරුව සහ එකී තනතුරේ ඉන් අනතුරුව වැඩ බැලූ නිලධාරියාගේ රාජකාරි කාලය අවසානයේ දී දෙවන පාර්ශ්වය විසින් පළමු පාර්ශ්වය මෙකී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන) තනතුර සඳහා පත්කර ඇති බවත්,

පළමු පාර්ශ්වයට අදාළ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන) තනතුර සමඟ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) තනතුර සඳහා දෙවන පාර්ශ්වයේ ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරිණිය වූ ටී. ජී. වසන්තා මහත්මිය යන අයව ද පත්කරනු ලැබූ බවත්,

2010.04.21 වන දින දෙවන පාර්ශ්වය විසින් එකී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) තනතුර අත්හිටුවනු ලැබූ බවත්, එහිදී ද පළමු පාර්ශ්වය විසින් හෙබවූ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන) තනතුර දිගටම පවත්වාගෙන යාමට දෙවන පාර්ශ්වය විසින් තීරණය කර තිබූ බවත්, එහෙත් අදාළ නිලධාරිනියට එකී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) තනතුරේ සහ වැටුප් තලයේම හිඳ 2013.12.31 වන දින විශ්‍රාම ගන්නා අවස්ථාව දක්වා කටයුතු කිරීමට දෙවන පාර්ශ්වය විසින් කටයුතු කර ඇති බවත්,

එහෙත් දෙවන පාර්ශ්වය විසින් සිය 2019.07.15 දිනැති ලිපිය මඟින් පළමු පාර්ශ්වය මෙතෙක් දැරූ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන) තනතුරේ සිට සහකාර කළමනාකරු (පරිපාලන) ලෙස තනතුරේ පිහිටුවා ඇති බවත් අදාළ දෙවන තනතුර පළමු තනතුරට වඩා අඩු වැටුපක් ලබන පහළ ස්ථරයක තනතුරක් බවත් පෙනී යයි.

එලෙස දෙවන පක්ෂයේ වැටුප් විෂමතා අනුකමිටුව විසින් 2019.07.15 වන දින ලිපිය මඟින් දැනුම් දුන් පරිදි පළමු පාර්ශ්වය විසින් වසර දහයකට (10) වැඩි සේවා කාලයක තනතුරු හොබවමින් සිටි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන) තනතුරට වඩා අඩු තනතුරක් සහ වැටුප් තලයක පිහිටි සහකාර කළමනාකරු (පරිපාලන) තනතුරේ පළමු පාර්ශ්වය පිහිටුවීමටත් වැඩිපුර වැටුප් ගෙවා ඇත්නම් ආපසු අයකර ගැනීම ද තීරණය කොට ඇත.

මෙම තීරණයට එරෙහිව පළමු පාර්ශ්වය විසින් ගාල්ල දිස්ත්‍රික් කම්කරු කාර්යාලය වෙත 2019.12.30 දිනැතිව කරන ලද පැමිණිල්ල ප්‍රකාරව සිදු කරන ලද පරීක්ෂණයෙන් අනතුරුව දෙවන පාර්ශ්වයේ එකී තීරණය අසාධාරණ හා අයුක්ති සහගත බවට තීරණය කොට ඇත. එකී තීරණයට දෙවන පාර්ශ්වය එකඟ නොවීම මත මෙම යොමුව කාර්මික ආරාවුල් පනත යටතේ බේරුම් කිරීම මඟින් විසඳීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමෙන් අනතුරුව මෙම විමසීම සඳහා මා වෙත යොමු කොට ඇත.

මෙහිදී දෙවන පාර්ශ්වයේ ස්ථාවරය සිය විරෝධතා ප්‍රකාශවල, ලිඛිත දේශන වලින් දක්වා ඇති පරිදි ඔවුන්ගේ ස්ථාවරය වන්නේ 11 වන පන්තියේ (සහකාර කළමනාකරු) පරිපාලන තනතුරට 2008.07.01 දින සිට බලපැවැත්වෙන පරිදි 2009/08/18(A6) ලිපිය මඟින් අන්තර්ග්‍රහණය කරන ලද බවත් 2009.11.18 දින සිට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන) තනතුරට පත් කරන ලද බවත් එහෙත් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් 2011.05.03 දිනැති ලිපිය මඟින් කළමනාකරණ චක්‍රලේඛ 30 ක්‍රියාත්මක කිරීමට ප්‍රථම පැවති වැටුප් ක්‍රම හා ආයතනයේ කාර්ය භාරය සළකා බලන විට HM - 1 වැටුප් කාණ්ඩයට අදාළ වන ජ්‍යෙෂ්ඨ කළමනාකාර සේවා ගණයේ නව තනතුරු ඇති කිරීම කළ නොහැකි බව දන්වන ලද හෙයින් එකී තනතුර අනුමත තනතුරක් නොවන බවත් අදාළ බලධාරීන්ගේ උපදෙස් මත වැටුප් විෂමතා නිවැරදි කර ඇති බවත් ඒ සඳහා ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ද ලැබී ඇති බැවින් මේ පිළිබඳව කිසිදු වෙනස්කමක් කිරීමට බලය දෙවන පාර්ශ්වයට නොමැති බවයි.

ඒ අනුව දෙවන පාර්ශ්වය දරන ස්ථාවරය වන ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරක් වන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන) තනතුරට නියමිත සුදුසුකම් පළවන පාර්ශ්වය සපුරා නොමැතිවීම හේතුවෙන් මධ්‍යම කළමනාකරණ සේවයේ තනතුරක් වන සහකාර කළමනාකරු පාලන තනතුරේ පළමු වන පාර්ශ්වය පිහිටුවීමට සිදු වී ඇති බවත් ය.

මේ පිළිබඳව පළමු වන පාර්ශ්වය වෙනුවෙන් ඉදිරිපත් වී ඇති සාක්ෂි හා ලේඛන විශ්ලේෂණයේදී පෙනී යන්නේ මෙම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන) තනතුර මෙම පාර්ශ්වය සේවයට බැඳීමට පෙර සිටම මෙම ආයතනයේ පැවති තනතුරක් බවත් එතෙක් ආයතනය විසින් නියම කොට පැවති සුදුසුකම් ඔහු විසින් සපුරා තිබූ බවත්ය. මෙම පළමු වන පාර්ශ්වය මෙම ආරාවුල උද්ගතවන අවස්ථාව දක්වා එකී තනතුරේ සිය රාජකාරී හා වගකීම් වල නිරතව ඇති බවත් එකී නිල තත්ත්වයෙන් ආයතනය නියෝජනය කර ඇත ඒ තනතුරට. එසේම 2011 වර්ෂයේදී ඉහත කී ප්‍රකාරව මෙම තනතුර අනුමත කළනොහැකි බවට දන්වා තිබියදී පවා 2020 වර්ෂයේ පළමු වන පාර්ශ්වය විශ්‍රාම යන අවස්ථාව දක්වා දෙවන පාර්ශ්වය විසින් ඔහු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන) ලෙස සිය පරිපාලන කටයුතුවලදී හඳුනාගෙන ඇති බවත් ඒ තනතුරේ රාජකාරී සිදු කොට ඇති බවටත් ඉදිරිපත් වූ සාක්ෂි අනුව පෙනී යයි. මෙම දෙවන පාර්ශ්වයේ නව බඳවා ගැනීමේ පටිපාටියක් 2015 වර්ෂයේ (R9) අනුමත කරගෙන ඇති බවත් ඒ අනුව මෙම දෙවන පාර්ශ්වය එකී තනතුර සඳහා අදාළ සුදුසුකම් නොමැති බවටද ආයතනය සාක්ෂි ඉදිරිපත් කොට ඇත. එහෙත් මෙලෙස වසර 10 කටත් අධික කාලයක් එකී තනතුරේ රාජකාරී සිදු කොට තිබියදී පසු අවස්ථාවකදී ඉහත පරිදි නිලය හා වැටුප පහළ හෙළීම සාධාරණ හා යුක්ති සහගත නොවන බව තීරණය කරමි. අවම වශයෙන් එකී තනතුර ඔහුට පුද්ගලික වන සේ ලබා දී, එකී පළමු වන පාර්ශ්වය විශ්‍රාමයාමෙන් පසුව එකී තනතුරු අහෝසි කිරීමට, ආයතනයට අදාළ බලධාරීන්ගෙන් ඉල්ලීම් කිරීමේ හැකියාව පවතී. නමුත් එවැනි උත්සාහයන් දරා ඇති බවට කරුණු අනාවරණය වී නොමැත. ඒ අනුව නව බඳවා ගැනීම් පටිපාටියක් මගින් එවැනි තනතුරක් ආයතනයට අනුමත කර නොමැති වීම හා / හෝ ඔහු එකී තනතුර සඳහා සුදුසුකම් සපුරා නොමැතිවීම මත එකී පළමුවන පාර්ශ්වය රැකියාවෙන් පහත හෙළීම තුළින් ඔහුගේ නීත්‍යානුකූල අපේක්ෂාවන් බිඳ වැටෙන ආකාරයෙන් දෙවන පාර්ශ්වය කටයුතු කර ඇති බව නිරීක්ෂණය කරමි. ඒ අනුව පහත සහනයන් පළමු වන පාර්ශ්වය වෙත ලබා දීමට තීරණය කරමි.

**ප්‍රදානය:**

ඒ අනුව මෙම ආරාවුලට අදාළව ඉදිරිපත් වූ සියළු සාක්ෂි, ලේඛන සළකා බැලීමෙන් අනතුරුව මා මෙසේ පහත පරිදි තීරණය කරමි.

මේ ආරාවුලේ පළමු පාර්ශ්වය වූ කේ. ඒ. පියසිරි මහතා වසර 12 කට ආසන්න කාලයක් අඛණ්ඩව භුක්ති විඳි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන) තනතුර හා එකී තනතුරට අදාළ වැටුපට වඩා අඩු තනතුරක් සහ වැටුප් තලයක පිහිටි සහකාර කළමනාකරු (පරිපාලන) තනතුරේ පළමු පාර්ශ්වය පිහිටුවීමට දෙවන පාර්ශ්වයේ වැටුප් විෂමතා අනුකමිටුව විසින් 2019.07.15 වන දිනැති ලිපිය මගින් දැනුම් දුන් තීරණය මගින් ඒ වන විටත් විශ්‍රාම යන වයසට ආසන්නව සිටි පළමු පාර්ශ්වයට අසාධාරණයක් හා අප්‍රතිකාරී හානි සිදුවී ඇති බවට අවසාන වශයෙන් තීරණය කරමි.

ඒ අනුව පළමු පාර්ශ්වය යළිත් 2019.06.01 දින සිට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන) තනතුරට අදාළ වැටුප් තලයේ පිහිටුවන ලෙසත්, එලෙස ඔහුගේ තනතුරු නාමය, වැටුප් පරිමාණය හා වැටුප් ක්ෂේත්‍රය පහත හෙලන ලද අවස්ථාවේ සිට ඔහු විශ්‍රාම යන අවස්ථාවට වන විට එකී තනතුරට අදාළව ඔහුට හිමිවිය යුතු හිඟ වැටුප්, හිඟ ව්‍යවස්ථාපිත දීමනා සහ හිඟ පාරිතෝෂිත දීමනා නිවැරදි ගණය කිරීමකින් අනතුරුව පළමු පාර්ශ්වය වෙත ගෙවනා ලෙසත් දෙවන පාර්ශ්වයට මෙයින් නියෝග කරමි.

පළමු පාර්ශ්වය විසින් 2024.02.06 දින සහ 2024.07.29 දින, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන) තනතුරට අදාළ හිඟ වැටුප් ගණනය කිරීමේ මූල්‍ය ප්‍රකාශයක් ඉදිරිපත් කොට ඇති අතර එම මූල්‍ය වාර්තාව පිළිබඳව දෙවන පාර්ශ්වය හෙවත් වගඋත්තරකාර ආයතනය විරෝධතාවයක් දක්වා නොමැත.

2019.06.01 දින සිට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන) තනතුරට අදාළ හිඟ වැටුප් ගණනය කිරීම පහත පරිදි වේ.

| වර්ෂය | කාල සීමාව | ලැබිය යුතු වැටුප රු. | ලැබූ වැටුප රු. | මාසික හිඟ මුදල රු. | මාස ගණන | හිඟ මුදල රු. |
|---|---|---|---|---|---|---|
| 2019 | 2019.06.01 සිට 2019.12.31 | 94,338.00 | 65,850.00 | 28,488.00 | මාස 07 | (28,488.00*7) 199,416.00 |
| 2020 | 2020.01.01 සිට 2020.01.31 | 105,265.00 | 75,405.00 | 29,860.00 | මාස 01 | (29,860.00*1) 29,860.00 |
| | 2020.02.01 සිට 2020.11.25 | 107,535.00 | 75,405.00 | 32,130.00 | මාස 10 | (32,130.00*10) 321,300.00 |
| | | | | | **මුළු හිඟ මුදල** | **රු. 550,576.00** |

ඉල්ලුම්කරුට ගෙවිය යුතු හිඟ වැටුප වන රු. 550,576.00 (රුපියල් පන් ලක්ෂ පනස් දහස් පන්සිය හැත්තෑ හයක) මුදල පළමු පාර්ශ්වයට ලබා ගැනීමට හැකි වන සේ මෙම නියෝගය ගැසට් පත්‍රයේ පළ වී මසක් ඇතුළත ගාල්ල දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කරන ලෙස දෙවන පාර්ශ්වයට මින් නියෝග කරමි.

තව ද අනෙකුත් ව්‍යවස්ථාපිත හිමිකම් දීමනා සඳහා මෙම ප්‍රදානය බාධාවක් නොවිය යුතුයි.

මෙය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බවට ප්‍රකාශ කරමි.

**නීතිඥ අමල් .ඒ. රන්දෙණිය,**
බේරුම්කරු.

2025 ක් වූ දෙසැම්බර් මස 09 වන දින දී ය.

EOG 03 – 0229

---

මගේ අංකය: IR/COM/03/2019/263.

**කාර්මික ආරාවුල් පනත – 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2023.12.04 දිනැති හා අංක 2361/02 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.11.30 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් අම්පාර, සේනානායකපුර, C/298/2, ඩබ්. එම්. සුනිල් ජයරත්න මහතා බාරේ ලිපිනයෙහි පදිංචි එම්. ජී. ඩී. මීවතුර මහතා සහ 1. කොළඹ 05, කිරුළ පාර, අංක 200 ලිපිනයෙහි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය 2. අම්පාර, අම්පාර ඩිපෝව ලිපිනයෙහි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/81/2023 හා 2025.09.17 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2026 මාර්තු මස 05 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේ දී ය.

නඩු අංකය - A/81/2023
යොමු අංකය - IR/COM/03/2019/263

එම්. ජී. ඩී. මීවතුර මහතා,
ඩබ්. එම්. සුනිල් ජයරත්න මහතා බාරේ,
C/298/2, සේනානායකපුර,
අම්පාර.

*පළමු පාර්ශ්වය*

01. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200,
කිරුළ පාර,
කොළඹ 05,.

01. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අම්පාර ඩිපෝව.

*දෙවන පාර්ශ්වය*

**ප්‍රදානය**

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර මහතා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ගරු කම්කරු ඇමතිතුමන් වෙත පැවරී ඇති බලතල අනුව, ඉහත පාර්ශ්වයන් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා සමාංක 2023.11.30 දින දරන නියෝගයෙන් බේරුම්කරු වශයෙන් මා පත්කර, මා වෙත යොමු කොට ඇත.

මෙම ආරාවුලට හේතුවී ඇති කරුණු වනුයේ.

“1998.05.02 දින මෙට්‍රො පොලිටන් බස් සමාගමේ කොන්දොස්තර ලෙස සේවයට බැඳී ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවකයෙකු ලෙස සේවය කරන එම්. ජී. ඩී. මීවතුර මහතාට රැකියාව මෙතෙක් ස්ථිර නොකිරීම, වැටුප් වැඩි නොකිරීම, වැටුප් වර්ධක හා අතිකාල දීමනා හිමි නම් එය ලබා නොදීම මඟින් අසාධාරණයක් සිදුව තිබේද යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන මොනවාද යන්නත් පිළිබඳව වේ.”

ඉල්ලුම්කරුගෙන් මුලින්ම වාචිකව කරුණු විමසා විමර්ශනය ආරම්භ කරන ලදී. මෙම ඉල්ලුම්කරු මුලින්ම සේවයට බැඳී ඇත්තේ 1998.05.02 දිනයේ දී ය. 1998.11.02 දින සේවය ස්ථිර කර ඇත. පටන්ගැනීමේ දී වැටුප රු. 12520/- කි. 1998.05.02 දින ගමනාගමන මණ්ඩලය මට්ටක්කුලිය ඩිපෝවේ සේවයට බැඳී මේ වන විට අම්පාර ඩිපෝවේ කොන්දොස්තර වරයෙක් වශයෙන් සේවය කර ඇත.

මොහුගේ මූලික වැටුප වාර්ෂිකව වැඩි කර නැත. ඉදිරිපත් වූ සාක්ෂි අනුව ඔහුට විරුද්ධව කිසිදු විෂමාචාරයක් තිබී නැත. ඔහුගේ සමකාලීනයන්ට වාර්ෂිකව වැටුප් වර්ධක දී ඇත. ඔහුගේ සේවය ස්ථිර කළ බවට සාක්ෂි ඇත. එහෙත් මෙම ඉල්ලුම්කරුට මේ දක්වා නිසිපරිදි වැටුප් වර්ධක දී නැත. ඒ ඒ. වර්ෂවලදී නියමිත පරිදි වැටුප් වර්ධක හා අනෙකුත් දීමනා දී නැත.

එහෙත් සේවා යෝජක පක්ෂයේ නීති නිලධාරිණී ශානිකා ගාල්ලගේ 2024.03.28 වන දින ප්‍රකාශ කළේ ඉල්ලුම්කරුගේ පුද්ගලික ලිපිගොනුව අස්ථානගත වී ඇති නිසා පත්වීම ස්ථිර කලාද යන්න සම්බන්ධයෙන් ගැටළුවක් ඇති වූ බවයි. (2024.03.28 දින නඩු වාර්තාවේ දෙවන පිටුවේ දෙවන ඡේදය)

මෙහිදී බේරුම්කාර මා නියෝගයක් කරමින් ප්‍රකාශ කළේ ඉල්ලුම්කරුගේ පත්වීම ස්ථිර කලාද නැත්ද යන්න වගඋත්තරකාර ආයතනය හොඳින් දත යුතු බවයි. ඊට හේතුව සේවකයාගේ පුද්ගලික ලිපිගොනු රැකබලා ගැනීම වගඋත්තරකාර පක්ෂයේ පරම වගකීම බැවින්ය.

ඉල්ලුම්කරු ඉදිරිපත් කළ 2024.05.26 දින දරන දිවුරුම් පෙත්සමෙන් අනතුරුව 2024.07.26 වන දින තවත් දිවුරුම් පෙත්සමක් ඉදිරිපත් කර ඇත. (නඩු ගොනුවේ 43 වන පිටුව). එම දිවුරුම් පෙත්සම කෙරෙහි මාගේ අවධානය යොමු කළෙමි.

ඉල්ලුම්කරු 1998.05.02 දින සිට කොන්දොස්තරවරයෙකු ලෙස සේවයට එක් වී ඇති බව එම දිවුරුම් පෙත්සමේ තුන්වන ඡේදය හා A 1 ලෙස අංකිත ලිපිය අනුව පැහැදිලිය.

දිවුරුම් පෙත්සමේ 4 වන ඡේදය හා අමුණා ඇති A 2 ලිපිය අනුව 1998.05.02 දිනැති පත්වීම 1998.11.02 දින සිට ස්ථිර කර ඇත. එබැවින් මෙම ඉල්ලුම්කරු වගඋත්තරකාර ආයතනයේ ස්ථිර සේවකයෙක් බව පැහැදිලිය. එම A 2 ලිපියේ 02 වන ඡේදය අනුව ඔහුගේ සේවය ස්ථිරය.

තවද එම ඡේදයේ සඳහන් වන පරිදි අවුරුදු 01 ක ප්‍රවාසන කාලයකට යටත්ය. කෙසේ වෙතත් මෙම සේවක මහතාගේ අනාචාරයක් හෝ අසතුටුදායක පැමිණීමක් ගැන සාක්ෂි ඉදිරිපත්ව නැත. ඉල්ලුම්කරුගේ පත්වීම ස්ථිර නොවන බවට කිසිදු සාක්ෂියක් වගඋත්තරකාර පාර්ශ්වය ඉදිරිපත් කර නැත. කෙසේ වෙතත් ඉල්ලුම්කරුගේ පුද්ගලික ලිපිගොනුව අස්ථානගත වී ඇති බව වගඋත්තරකාර පක්ෂය කියන බැවින් ඉල්ලුම්කරුගේ පත්වීම ස්ථිර නොකළ බව වගඋත්තරකාර පක්ෂයට කිව නොහැක. (නඩු ගොනුවේ 14 පිටුවේ 2 වන ඡේදයත්, 3 වන ඡේදයේ දැක්වෙන බේරුම්කරුගේ නියෝගය බලන්න)

වගඋත්තරකරුවන්ගේ 2024.08.13 දිනැති දිවුරුම් ප්‍රකාශයේ 4(iii) ඡේදයේ අසත්‍ය කරුණු හුවා දක්වා ඇත. ඉල්ලුම්කරු ඉදිරිපත් කළ A 1 ලිපියේ ඔහුගේ ප්‍රවාසන කාලය ලෙස දක්වා ඇත්තේ අවුරුදු 01 කි. එහෙත් එම ප්‍රවාසන කාලය අවුරුදු 03 ක් යැයි වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් දිවුරුම් ප්‍රකාශය ඉදිරිපත් කළ S. A. D. තුසිත චමින්ද සිරිවර්ධන පවසන්නේ අමූලික බොරුවකි. “එසේම අයදුම්කරුගේ තුන් අවුරුදු ප්‍රවාසන කාලය අවසානයේ සේවය ස්ථිර කිරීම සඳහා අවශ්‍ය අවශ්‍යතා සපුරා නොතිබීම” යනුවෙන් මන:කල්පිත ප්‍රකාශයක් එම 4(iii) ඡේදයේ සඳහන් කර ඇත.

සිරිවර්ධන ආරච්චිගේ දොන් තුසිත චමින්ද සිරිවර්ධන බෞද්ධයෙක් බැවින් එම දිවුරුම් ප්‍රකාශයේ අග සඳහන් පරිදි ඔහුට දිවුරුම් ප්‍රකාශයක් දිය නොහැක. එබැවින් ඔහුගේ 2024.08.13 දරන ඊනියා දිවුරුම් ප්‍රකාශය මම ප්‍රතික්ෂේප කරමි. අසත්‍ය දිවුරුම් ප්‍රකාශ ඉදිරිපත් කිරීම දඬුවම් ලැබිය හැකි වරදකි.

ඉදිරිපත් වූ දිවුරුම් ප්‍රකාශ හා සාක්ෂි අනුව ඉල්ලුම්කරු වගඋත්තරකාර ආයතනයේ ස්ථිර සේවකයෙක් බව මම නිගමනය කරමි. ඉල්ලුම්කරුගේ සාක්ෂිය හා ඔහුගේ 2024.07.26 දිනැති දිවුරුම් පෙත්සම කෙරෙහි අවධානය යොමු කරමි. එම දිවුරුම් පෙත්සමේ 5 වන ඡේදය අනුව ඉල්ලුම්කරුට 2008.01.01 දින සිට රු. 9165.00 වැටුප් තලයේ තබා වැටුප් ගෙවා ඇත. ඒ බව ඉල්ලුම්කරු ඉදිරිපත් කළ A 3 නම් ලේඛනයේ සඳහන් වේ. එසේම ඒ බව ඉල්ලුම්කරු සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත. (2024.08.23 නඩු වාර්තාවේ 81 වන පිටුවේ 13 වන පේළිය).

ඉල්ලුම්කරුගේ 2024.07.26 වන දිනැති දිවුරුම් පෙත්සමේ 6 වන ඡේදයට අනුව 2012 අංක 01 දරන චක්‍රලේඛයට අනුව 2012.03.01 සිට රු. 13155.00 ක වැටුප් තලයේ තබා වැටුප් ගෙවිය යුතු වුවද ඔහුට රු. 12520.00 ක වැටුප් තලයේ තබා වැටුප් ගෙවා ඇති බවද 2015.10 වන මාසයේ ද මූලික වැටුප ලෙස ගෙවා ඇත්තේ රු. 12520.00 කි. ඒ බව A 6 ලේඛනයෙන් පෙනේ. එහෙත් ඉල්ලුම්කරුගේ සාක්ෂිය අනුව ගෙවිය යුතු වැටුප රු. 13155.00 කි. මෙසේ ගෙවිය යුතු වැටුප රු. 13155.00 ක් බව වගඋත්තරකාර පාර්ශ්වය ප්‍රතික්ෂේප කර නැත. එබැවින් එය පිළිගත යුතු කරුණකි.

ඉල්ලුම්කරු ප්‍රකාශ කරන පරිදි 2012.03.01 දින වන විට රු. 13155.00 ක වැටුපක් ගෙවිය යුතුය. එහෙත් ගෙවා ඇත්තේ රු. 12,520.00 කි. 2015 ඔක්තෝබර් මාසයේදී ගෙවා ඇත්තේ රු. 12520.00 ක් පමණි. මේ අනුව 2012.03.01 දින සිට 2015 ඔක්තෝබර් 01 දක්වාම මසකට (රු. 13155.00 - රු. 12520.00) රු. 635.00 ක් අඩුවෙන් ගෙවා ඇත. 2012.03.01 සිට 2015.10.01 දක්වා කාලය මාස 43 කි.

| | | |
|---|---|---|
| මේ අනුව 2012.03.01 සිට 2015.10.01 දක්වා වැටුපෙන් අඩුවෙන් ගෙවූ මුදල | = | රු. 635 x 43 |
| | = | රු. 27305.00 කි. |

2015, 10 වන මාසයේ දී ඉල්ලුම්කරුට ගෙවා ඇති මූලික වැටුප රු. 12520.00 කි. එහෙත් ඉල්ලුම්කරු කියන පරිදි එම මාසයේදී ඉල්ලුම්කරුට ගෙවිය යුතු මුදල රු. 22120.00 කි. තවද 2015 ඔක්තෝබර් මාසයේ සිට 2016 ඔක්තෝබර් මාසය දක්වා ඉල්ලුම්කරුට ගෙවා ඇති මූලික මාසික වැටුප රු. 12520.00 කි. ඉල්ලුම්කරු කියන පරිදි එම කාලවකවානුවේ ගෙවිය යුතු මූලික වැටුප රු. 22,250.00 කි. ඉල්ලුම්කරු කියා සිටින මෙම මුදල් වැරදි යයි වගඋත්තරකාර පාර්ශ්වය ප්‍රකාශ කර නැත. එහෙත් ගෙවිය යුතු මූලික වැටුප රු. 22120.00 යැයි ප්‍රකාශ කර ඉන්පසුව නැවතත් රු. 22250.00 ක් යයි ප්‍රකාශ කර ඇත. මේ අනුව සාධාරණත්වයේ නාමයෙන් ගෙවිය යුතු මූලික වැටුප රු. 22120.00 ක් බව මම භාරගනිමි.

**මෙම වකවානුවේ අඩුවෙන් ගෙවා ඇති මුදල් ගණනය කිරීම.**

| | | |
|---|---|---|
| 2015 ඔක්තෝබර් මස 01 දින සිට 2016 ඔක්තෝබර් 01 දින දක්වා කාලය | = | මාස 12 |
| මාසයකදී අඩුවෙන් ගෙවූ මුදල | = | රු. 22120.00 - රු. 12520.00 |
| | = | රු. 9600.00 |
| 2015 ඔක්තෝබර් මස 01 දින සිට 2016 ඔක්තෝබර් 01 දින දක්වා අඩුවෙන් ගෙවූ මුදල | = | රු. 9600.00 x 12 |
| | = | රු. 115,200/= |
| ඉල්ලුම්කරු කියන පරිදි 2016 ඔක්තෝබර් මසින් පසුව මසකට ගෙවිය යුතු වැටුප | = | රු. 22330.00 |
| ඒ අනුව 2016 ඔක්තෝබර් මස 01 සිට දෙසැම්බර් 31 දක්වා අඩුවෙන් ගෙවා ඇති මුදල | = | රු. (22330 - 12520) x 03 |
| | = | රු. 29,430.00 |

| | | |
|---|---|---|
| 2017 වර්ෂයේදී ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා ඉල්ලුම්කරු කියන පරිදි ගෙවිය යුතු මාසික මූලික වැටුප | = | රු. 22,630.00 |
| ඒ අනුව 2017 වර්ෂයේ දී අඩුවෙන් ගෙවා ඇති මුදල | = | රු. (22630.00 - රු. 12520.00) x 12 |
| | = | රු. 121320/= |
| 2018 වර්ෂයේ ඉල්ලුම්කරු කියන පරිදි ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා ගෙවිය යුතු මාසික මූලික වැටුප | = | රු. 22,930.00 |
| ඒ අනුව 2018 වර්ෂයේ දී අඩුවෙන් ගෙවා ඇති මුදල | = | රු. (22930.00 - රු. 12520.00) x 12 |
| | = | රු. 124920/= |
| 2019 වර්ෂයේ ඉල්ලුම්කරු කියන පරිදි ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා ගෙවිය යුතු මාසික මූලික වැටුප | = | රු. 26,710.00 |
| ඒ අනුව 2019 වර්ෂයේ දී අඩුවෙන් ගෙවා ඇති මුදල | = | රු. (26,710.00 - රු. 12520.00) x 12 |
| | = | රු. 170280/= |
| 2020 ජනවාරි 01 සිට 2020 ජූලි 31 දක්වා අඩුවෙන් ගෙවා ඇති මුදල | = | රු. (26,710.00 - රු. 12520.00) x 7 |
| | = | රු. 99330/= |
| දිවුරුම් ප්‍රකාශයේ 83 වන පිටුවේ 2 වන ඡේදය අනුව ඉල්ලුම්කරු කියන පරිදි 2020 අගෝස්තු මාසයේ ඇති කළ වැටුප් සංශෝධනය අනුව මසකට ගෙවිය යුතු මූලික වැටුප | = | රු. 26,710.00 + රු. 4200.00 |
| | = | රු. 30910.00 |
| ඒ අනුව 2020 අගෝස්තු මස 01 දින සිට 2020 දෙසැම්බර් මස 31 දක්වා අඩුවෙන් ගෙවා ඇති මුදල | = | (රු. 30,910.00 - රු. 12520.00) x 5 |
| | = | රු. 91950.00 |
| ඒ අනුව 2020 ජනවාරි මස 01 සිට දෙසැම්බර් මස 31 දක්වා අඩුවෙන් ගෙවා ඇති මුදල | = | රු. 99330.00 + රු. 91950.00 |
| | = | රු. 191280.00 |
| 2021 ජනවාරි මස 01 දින සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා මාසිකව ගෙවිය යුතු මුදල | = | රු. 32940.00 |
| ඒ අනුව 2021 ජනවාරි මස 01 දින සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා අඩුවෙන් ගෙවා ඇති මුදල | = | (රු. 32940.00 - රු. 12520.00) x 12 |
| | = | රු. 245040/= |

83 වන පිටුවේ 07 වන ඡේදය බලන්න.

| | | |
|---|---|---|
| 2022 ජනවාරි මස 01 දින සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා මාසිකව ගෙවිය යුතු මුදල | = | රු. 33240.00 |
| ඒ අනුව 2022 ජනවාරි මස 01 දින සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා අඩුවෙන් ගෙවා ඇති මුදල | = | (රු. 33240.00 - රු. 12520.00) x 12 |
| | = | රු. 248640/= |

83 වන පිටුවේ 09 වන ඡේදය බලන්න.

| | | |
|---|---|---|
| 2023 ජනවාරි මස 01 දින සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා මාසිකව ගෙවිය යුතු මුදල | = | රු. 33540.00 |
| ඒ අනුව 2023 ජනවාරි මස 01 දින සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා අඩුවෙන් ගෙවා ඇති මුදල | = | (රු. 33540.00 - රු. 12520.00) x 12 |
| | = | රු. 252240/= |

84 වන පිටුව බලන්න.

| | | |
|---|---|---|
| 2024 ජනවාරි මස 01 දින සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා මාසිකව ගෙවිය යුතු මුදල | = | රු. 33840.00 |
| ඒ අනුව 2024 ජනවාරි මස 01 දින සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා අඩුවෙන් ගෙවා ඇති මුදල | = | (රු. 33840.00 - රු. 12520.00) x 12 |
| | = | රු. 255840/= |

ඉල්ලුම්කරුට ගෙවිය යුතු හිඟ අතිකාල මුදල් හා අනෙකුත් දීමනා මා වෙත ලැබී නැත. **2025 වසර සඳහා ද අඩුවෙන් ගෙවූ වැටුප් ප්‍රමාණ ගණනය කර ගෙවිය යුතුය.**

| | | | |
|---|---|---|---|
| 2012.03.01 සිට 2015.10.01 දක්වා | = | රු. | 27305.00 |
| 2015 ඔක්තෝබර් සිට 2016 ඔක්තෝබර් දක්වා | = | රු. | 115200.00 |
| 2016 ඔක්තෝබර් සිට 2016 දෙසැම්බර් දක්වා | = | රු. | 29430.00 |
| 2017 ජනවාරි සිට 2017 දෙසැම්බර් දක්වා | = | රු. | 121320.00 |
| 2018 ජනවාරි සිට 2018 දෙසැම්බර් දක්වා | = | රු. | 124920.00 |
| 2019 ජනවාරි සිට 2019 දෙසැම්බර් දක්වා | = | රු. | 170280.00 |
| 2020 ජනවාරි සිට 2020 දෙසැම්බර් දක්වා | = | රු. | 191280.00 |
| 2021 ජනවාරි සිට 2021 දෙසැම්බර් දක්වා | = | රු. | 245040.00 |
| 2022 ජනවාරි සිට 2022 දෙසැම්බර් දක්වා | = | රු. | 248640.00 |
| 2023 ජනවාරි සිට 2023 දෙසැම්බර් දක්වා | = | රු. | 252240.00 |
| 2024 ජනවාරි සිට 2024 දෙසැම්බර් දක්වා | = | රු. | 255840.00 |
| **මේ අනුව ගෙවිය යුතු සම්පූර්ණ මුළු මුදල** | **=** | **රු.** | **1,781,495.00** |

1 වන පාර්ශ්වයේ සාක්ෂි අවසානයේ දෙවන පාර්ශ්වය සාක්ෂි දී ඇත. ඉන්පසු දෙවන පාර්ශ්වය වෙනුවෙන් සහකාර මුදල් කළමනාකාර නිෂා කුමාරි සාක්ෂි දී ඇත. (2025.01.20 දින සාක්ෂි සටහන්)

ඇය ප්‍රකාශ කරන්නේ ඉල්ලුම්කරුගේ පත්වීම ස්ථිර කරන ලද ලිපියක් ගිණුම් අංශයට ලැබී නැති බවය. සාක්ෂිකාරිය ප්‍රකාශ කළේ අසා දැනගත් සාක්ෂියකි. එය පිළිගත නොහැක. හේතුව (hear say නිසා) එසේම ඉල්ලුම්කරුගේ පත්වීම ස්ථිර නොකළ බවට සඵල සාක්ෂියක් ඇය නොදේ. ඇය එසේ කියන්නේ ඉල්ලුම්කරුගේ පත්වීමේ ලිපියක් ඇයගේ අංශයට ලැබී ඇති නිසාය. තවද ඇය කියන්නේ ලේඛනයක් නැති නිසා ඉල්ලුම්කරුගේ පත්වීම ස්ථිර කලාද යන්න කිව නොහැකි බවයි. ඉන්පසුව ඇය ප්‍රකාශ කරන්නේ 2024.07 වන මාසයේ දී ස්ථිර සේවකයෙක් බවට ලිපියක් නිකුත් කළ බව නමුත් ඉල්ලුම්කරුට 2009.09.30 දින පත්වීම ස්ථිර කළ ලිපියක් දී තිබියදී නැවත 2024 වර්ෂයේ දී පත්වීම ස්ථිර කළ බවට ලිපියක් දීම විහිළුවකි. (A 2, A 13, A 14 ලෙස ලකුණු කළ ලිපි)

මේ අවස්ථාවේ සාක්ෂිකාරිය ප්‍රකාශ කළේ මේ පිළිබඳව ගිණුම් අංශය දැනුවත් නැති බවය. තවද ඇය ප්‍රකාශ කරන්නේ 2012 මෙන්ම 2015 වසරේ දී ඉල්ලුම්කරුට හිමි වැටුප ගැන කිසිවක් කිව නොහැකි බවයි. තවද 2022, 2023, 2024 වර්ෂවල ඉල්ලුම්කරුට ගෙවිය යුතු වැටුප් ගැනද ඇයට කිසිවක් කිව නොහැකි බවයි. (සාක්ෂි සටහන්වල 108, 169 පිටු)

මේ අනුව සාක්ෂිකාර නිෂා කුමාරි මිය කිසිවක් නොකී අයෙක් බවට නිගමනය වේ. (She spoke nothing) ඉන්පසු පැමිණි නියෝජ්‍ය මානව සම්පත් කළමනාකාර සේනක තුඩුගල මයා ද සඵල සාක්ෂියක් දී නැත. ඉල්ලුම්කරුගේ සාක්ෂි බිඳ හෙලීමට ඔහුට නොහැකි විය.

මේ සියළු කරුණු සළකා බලා මා නිගමනය කරන්නේ ඉල්ලුම්කරු 1998.05.02 වන දින දුන් පත්වීම 1998.11.02 දින ස්ථිර කර ඇති බවයි. ඉල්ලුම්කරුගේ පුද්ගලික ලිපිගොනුව ආරක්ෂා කරගැනීම වගඋත්තරකාර පක්ෂයේ වගකීමක් බැවින් එම ලිපි ගොනුව අස්ථානගතවීමේ වාසිය වගඋත්තරකාර පක්ෂයට අයත් නොවන බවයි.

ඉදිරිපත් වූ සාක්ෂි අනුව ඉල්ලුම්කරුට අහිමි වූ මූලික වැටුප රු. 1,781,495.00 කි. මෙම ඉල්ලුම්කරුට අහිමි වූ අතිකාල මුදල් ප්‍රමාණය හා සේවක අර්ථසාධක මුදල් ප්‍රමාණය ගණනය කිරීමට තරම් ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත්ව නැත. තවද අනෙකුත් ව්‍යවස්ථාපිත හිමිකම් සඳහා මෙම ප්‍රදානය බාධාවක් නොවිය යුතුය.

ඒ අනුව ඉල්ලුම්කරුට ගත හැකිවන පරිදි රු. 1,781,495.00 (දාහත් ලක්ෂ අසූ එක් දහස් හාරසිය අනූ පහක) මුදලක් මෙය ගැසට්ගතවීමෙන් මසක් ඇතුළත නැගෙනහිර කොළඹ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කරන ලෙස දෙවන පාර්ශ්වයට නියම කරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව සහතික කරමි.

**නීතිඥ විජිතානන්ද මඩවලගම,**
බේරුම්කරු.

2025 සැප්තැම්බර් මස 17 වැනි දින.

EOG 03 – 0230

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.